සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

# 25 B - යුරෝපා ඉතිහාසය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන / සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

Department of Examinations - Sri Lanka

Department of Examinations - Sri Lanka

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

## 25 B - යුරෝපා ඉතිහාසය

## ලකුණු බෙදී යාමේ ආකාරය

I පත්‍රය  01 x 40 = 40

II පත්‍රය

| | | |
|---|---|---|
| අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = | 12 |
| සෙසු ප්‍රශ්න 3 කට 16 බැගින් | = | 48 |
| II පත්‍රය අවසාන ලකුණු | = | 60 |

අවසාන ලකුණු = 40 + 60 = 100

Department of Examinations - Sri Lanka

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ √ △ $\frac{4}{5}$
............................................................
............................................................

(ii) ............................................................
............................................................ √ △ $\frac{3}{5}$
............................................................

(iii) ............................................................
............................................................ √ △ $\frac{3}{5}$
............................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

Department of Examinations - Sri Lanka

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***



Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

| | |
|---|---|
| යුරෝපා ඉතිහාසය II (I කොටස)<br>ஐரோப்பிய வரலாறு II (பகுதி I)<br>History of Europe II (Part I) | 25 B S II |
| පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි<br>மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time - 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා

විභාග අංකය: ......................................

**උපදෙස්:**
* මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහ බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
* මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
* කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු, I කොටස, II කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නො ගැළපේ. එම නො ගැළපෙන නම කුමක් දැ'යි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

1. (1) තේම්ස් (2) එල්බ් (3) ඩැන්සිග්
   (4) විස්ටියුලා (5) පෝ (.........)

2. (1) තීබ්ස් (2) මෙගාර (3) ඩෙල්ෆි
   (4) ආර්ගෝස් (5) පොම්පෙයි (.........)

3. (1) ඇක්‍රොපොලිස් (2) බොලොඤ්ඤා (3) පැරිස්
   (4) ඔක්ස්ෆඩ් (5) පාදුවා (.........)

4. (1) ඊස්කිලස් (2) සොෆොක්ලීස් (3) යුරිපිඩීස්
   (4) ටැසිටස් (5) ඇරිස්ටොෆනීස් (.........)

5. (1) මිනොවන්වරු (2) ඔස්ට්‍රොගොත්වරු (3) ඇන්ග්ලො-සැක්සන්වරු
   (4) ලොම්බාර්ඩ්වරු (5) ෆ්‍රෑන්ක්වරු (.........)

6. (1) නිකොලස් කොපර්නිකස් (2) ෆ්‍රැන්සිස්කො පිසාරෝ (3) ගැලීලියෝ ගැලිලි
   (4) ජොහැන්නස් කෙප්ලර් (5) අයිසැක් නිව්ටන් (.........)

7. (1) බොහිමියන් අවධිය (2) ඩෙනිෂ් අවධිය (3) ජර්මන් අවධිය
   (4) ස්වීඩිෂ් අවධිය (5) ප්‍රංශ අවධිය (.........)

8. (1) මහා ෆ්‍රෙඩරික් (2) ලුවී පිලිප් (3) මහා කැතරින්
   (4) මරියා තෙරේසා (5) දෙවන ජෝශප් (.........)

9. (1) කෝසිකා (2) සිසිලි (3) එල්බා
(4) සාන්ත හෙලේනා (5) සාර්ඩීනියා (.........)

10. (1) ලොයිඩ් ජෝර්ජ් (2) ජෝර්ජ් ක්ලෙමන්සෝ (3) විටෝරියෝ ඔර්ලැන්ඩෝ
(4) ජෝසප් ස්ටාලින් (5) වුඩ්රෝ විල්සන් (.........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක් පද එකිනෙකට **නො ගැළපේ**. එම නො ගැළපෙන යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) සියුස් - ඔලිම්පියා
(2) ඇතීනා - ඇතන්ස්
(3) ජුපිටර් - ස්පාර්ටා
(4) ඇපොලෝ - ඩෙල්ෆි
(5) ඇෆ්‍රොඩයිට් - කොරින්ත් (.........)

12. (1) ක්ලිස්තිනීස් - ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ පියා
(2) හිපොක්‍රටීස් - වෛද්‍ය විද්‍යාවේ පියා
(3) හෙරොඩෝටස් - ඉතිහාසයේ පියා
(4) පෙට්‍රාක් - මානවවාදයේ පියා
(5) ලුවී බ්ලාන්ක් - විද්‍යාත්මක සමාජවාදයේ පියා (.........)

13. (1) බයිසැන්ටයින් අධිරාජ්‍යය - කොන්ස්තන්තිනෝපලය
(2) ඔටෝමන් අධිරාජ්‍යය - ජෙරුසලම
(3) ඔස්ට්‍රියානු අධිරාජ්‍යය - වියනා
(4) ප්‍රංශ අධිරාජ්‍යය - පැරිස්
(5) ජර්මන් අධිරාජ්‍යය - බර්ලින් (.........)

14. (1) සියක් අවුරුදු යුද්ධය - එංගලන්තය පාර්ශවකරුවෙකි.
(2) තිස් අවුරුදු යුද්ධය - එංගලන්තය පාර්ශවකරුවෙකි.
(3) හත් අවුරුදු යුද්ධය - එංගලන්තය පාර්ශවකරුවෙකි.
(4) ක්‍රිමියානු යුද්ධය - එංගලන්තය පාර්ශවකරුවෙකි.
(5) පළමුවන ලෝක යුද්ධය - එංගලන්තය පාර්ශවකරුවෙකි. (.........)

15. (1) තොමස් හොබ්ස් - ලෙවියතාන් (Leviathan)
(2) ජෝන් ලොක් - ආණ්ඩුව පිළිබඳ ගැඹුරු නිබන්ධන දෙක (Two Treatises of Government)
(3) ජීන් ජැක් රූසෝ - නීතියේ සාරය (The Spirit of the Laws)
(4) ඇඩම් ස්මිත් - ජාතීන්ගේ ධනය (Wealth of Nations)
(5) වී. අයි. ලෙනින් - රජය සහ විප්ලවය (State and Revolution) (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පමෙහන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය තෝරා වරහන තුළ** ලියන්න.

16.

| X | | Y |
|---|---|---|
| (i) ජූලියස් සීසර් | A | "තත්කාලීන වැදගත් ප්‍රශ්න විසඳනු ලබන්නේ කථා පැවැත්වීමෙන් හෝ බහුතරයකගේ යෝජනා සම්මත කිරීමෙන් හෝ නොව........ ලෙයින් සහ යකඩෙනි." |
| (ii) දාහතරවන ලුවී | B | "විප්ලවය යනු මම වෙමි." |
| (iii) නැපෝලියන් බොනපාට් | C | "බෝල්ටික් මුහුදේ සිට අද්‍රියාතික් මුහුද දක්වා [යුරෝපා] මහද්වීපය හරහා අයෝමය තිරයක් වැටී ඇත." |
| (iv) ඔටෝ ෆොන් බිස්මාර්ක් | D | "මම පැමිණියෙමි, මම දුටිමි, මම ජයගතිමි." |
| (v) වින්ස්ටන් චර්චිල් | E | "රජය යනු මම වෙමි." |

(1) ABECD (2) AEDCB (3) BAECD (4) DEABC (5) DEBAC (.........)



Department of Examinations - Sri Lanka

17.

| X | | Y |
|---|---|---|
| (i) | අඳුරු මහද්වීපය | A බ්‍රිතාන්‍යය |
| (ii) | නව ලෝකය | B අප්‍රිකාව |
| (iii) | සාප්පුකාර ජාතිය | C ඉතාලිය |
| (iv) | භූගෝලීය ප්‍රකාශනයක් පමණකි. | D තුර්කිය |
| (v) | යුරෝපයේ රෝගියා | E අමෙරිකාව |

(1) ABDEC (2) BADEC (3) BAECD (4) BEACD (5) CDAEB (.........)

18.

| X | | Y |
|---|---|---|
| (i) | බැස්ටිලය බිඳ හෙළීම | A අමෙරිකා එක්සත් ජනපදය දෙවන ලෝක යුද්ධයට ඇතුළුවීම |
| (ii) | ස්පාඤ්ඤ වංශය | B දෙවන ලෝක යුද්ධයේ අවසානය |
| (iii) | ෆ්‍රැන්සිස් ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා ඝාතනය කිරීම | C නැපෝලියන් බොනපාට්ගේ වැටීම |
| (iv) | පර්ල් වරායට එල්ල කළ ජපන් ප්‍රහාරය | D ප්‍රංශ විප්ලවය ආරම්භ වීම |
| (v) | හිරෝෂිමා සහ නාගසාකි වෙත පරමාණු බෝම්බ හෙළීම | E පළමුවන ලෝක යුද්ධය ආරම්භ වීම |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EACDB (5) ECADB (.........)

19.

| X | | Y |
|---|---|---|
| (i) | වී. අයි. ලෙනින් | A රතු හමුදාව |
| (ii) | ලියොන් ට්‍රොට්ස්කි | B බටහිර සමඟ සාමකාමී සහජීවනය |
| (iii) | ජෝසප් ස්ටාලින් | C ග්ලස්නොස්ට් (විවෘතභාවය) සහ පෙරෙස්ත්‍රොයිකා (ආර්ථික ප්‍රතිව්‍යුහකරණය) |
| (iv) | නිකිතා කෲෂ්චෙව් | D පස් අවුරුදු සැලැස්ම |
| (v) | මිහායල් ගර්බචෙව් | E නව ආර්ථික ප්‍රතිපත්තිය |

(1) ACEBD (2) AEDBC (3) DEACB (4) EADBC (5) EDACB (.........)

20.

| X | | Y |
|---|---|---|
| (i) | ට්‍රිග්වි ලී | A බුරුමය |
| (ii) | ඩැග් හැමර්ෂල් | B නෝර්වේ |
| (iii) | යූ තාන්ට් | C ඔස්ට්‍රියාව |
| (iv) | කුර්ට් වෝල්ඩ්හයිම් | D පේරු |
| (v) | ජාවියර් පෙරේස් ඩි කුවෙලාර් | E ස්වීඩනය |

(1) BEACD (2) CABED (3) CEABD (4) DECBA (5) EDABC (.........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට **නො ගැළපේ**. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21. ග්‍රීක පෞර රාජ්‍ය
    (1) ග්‍රීක පෞර රාජ්‍යය "පෝලිස්" නමින් හැඳින්විණි.
    (2) ග්‍රීක පෞර රාජ්‍ය ක්‍රි.පූ. අටවන සියවසේ දී ආරම්භ විය.
    (3) ග්‍රීක පෞර රාජ්‍යය, භූමි ප්‍රමාණය හා ජනගහණය යන දෙඅංශයෙන්ම එකිනෙකින් වෙනස් විය.
    (4) පෙරික්ලීස්ගේ සමයේ දී ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදය පරිපූර්ණත්වයට පත්විය.
    (5) පෙලපොනීසියානු යුද්ධය ග්‍රීකයන් හා පර්සියානුවන් අතර හටගත්තේ ය. (.........)

22. කිතු දහම
    (1) කිතු දහම ඒක දේවවාදී ආගමකි.
    (2) ක්‍රි.ව. තුන්වන සියවස තෙක් රෝම පාලකයෝ කිතුනුවන්ට වධ හිංසා කළහ.
    (3) ක්‍රි.ව. තුන්වන සියවස අවසාන වනවිට කිතු දහම රෝම අධිරාජ්‍යය පුරාම වාගේ පැතිර පැවතුණි.
    (4) ඩෙසියස් නම් රෝම අධිරාජ්‍යයා කිතුනුවන්ට වධ හිංසා කිරීම අවසන් කළේය.
    (5) කිතු දහම තියඩෝසියස් විසින් රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බවට පත් කරනු ලැබීය. (.........)



Department of Examinations - Sri Lanka

**23.** වැඩවසම් ක්‍රමය
(1) මධ්‍යතන යුරෝපයේ දේශපාලන හා ආර්ථික ක්‍රමය වැඩවසම් ක්‍රමය නමින් හඳුන්වනු ලැබේ.
(2) වැඩවසම් ක්‍රමය ෆ්‍රෑන්ක් රාජධානියෙහි ආරම්භ වී යුරෝපයේ අන් ප්‍රදේශවලට පැතිර ගියේය.
(3) වැඩවසම් ක්‍රමය යටතේ මධ්‍යම පාන්තිකයෝ රජයෙන් ඉඩම් ලබාගෙන රජුට සේනා සැපයූහ.
(4) වැඩවසම් ක්‍රමය ප්‍රවේණිගම් ක්‍රමය (බණ්ඩාරගම් ක්‍රමය) මත ගොඩනැගී තිබුණි.
(5) වැඩවසම් ක්‍රමය යටතේ දේශපාලන බලය විකේන්ද්‍රගතව පැවතුණි. (.........)

**24.** ආගමික ප්‍රතිසංස්කරණය
(1) ආගමික ප්‍රතිසංස්කරණය ජර්මනියේ ආරම්භ විය.
(2) ආගමික ප්‍රතිසංස්කරණය පුනරුදය ඇතිවීමට මග පෑදීය.
(3) කතෝලික සභාව ආශ්‍රිතව පැවති දූෂණ, ආගමික ප්‍රතිසංස්කරණය ඇතිවීමට තුඩුදුන් ප්‍රධාන හේතුවකි.
(4) මාටින් ලූතර් ආගමික ප්‍රතිසංස්කරණයේ ආරම්භකයා ලෙස සැලකේ.
(5) 1517 දී කරුණු අනූ පහකින් යුත් ලියවිල්ලක් විටෙන්බර්ග් දේවස්ථාන දොරටුවේ සවි කිරීම ආගමික ප්‍රතිසංස්කරණයේ ආරම්භය සලකුණු කරයි. (.........)

**25.** පළමුවන ලෝක යුද්ධය
(1) පළමුවන ලෝක යුද්ධය 1914 දී ආරම්භ විය.
(2) ජර්මනිය, ඔස්ට්‍රියා-හංගේරියාව, තුර්කිය සහ බල්ගේරියාව මධ්‍යම බලවතුන් ලෙස හැඳින්වින.
(3) රුසියාව, ප්‍රංශය, බ්‍රිතාන්‍යය, ඉතාලිය හා අමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර ජාතීන් ලෙස හැඳින්වින.
(4) වර්සායි ගිවිසුම ජර්මනිය සමඟ අත්සන් කරන ලදී.
(5) ශාන්ත ජර්මේන් ගිවිසුම තුර්කිය සමඟ අත්සන් කරන ලදී. (.........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ........ **5** ද, වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26.** 15 වන හා 16 වන සියවස්වල ඇති වූ දේශ ගවේෂණ සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) මුල්ම දේශ ගවේෂණ මුහුදු යාත්‍රික ගමන් පෘතුගීසීන් හා ස්පාඤ්ඤයන් විසින් සිදු කරන ලදී.
(B) දේශ ගවේෂණ මුහුදු යාත්‍රික ගමන්වල ප්‍රධාන අරමුණ වූයේ ආසියාවට ළඟාවීම සඳහා නව මාර්ගයක් සොයා ගැනීමයි.
(C) ෆර්ඩිනන්ඩ් මැගලන් අමෙරිකා මහද්වීපය සොයා ගත්තේ ය.
(D) වෝල්ටර් රැලේ ලෝ වටා යාත්‍රා කළේ ය. (.........)

**27.** 1688-89 උත්කෘෂ්ට විප්ලවය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) දෙවන ජේම්ස් සිහසුනෙන් පහකරන ලදී.
(B) මේරි හා ඔරෙන්ජ්හි විලියම් එංගලන්තයේ සම පාලකයන් බවට පත් වූහ.
(C) උත්කෘෂ්ට විප්ලවය, එංගලන්තයේ ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් සඳහා පදනම දැමීය.
(D) අයිතිවාසිකම් පනත නීතියක් බවට පත්විය. (.........)

**28.** රිචලියු සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) පහළොස්වන ලුවී රජතුමාගේ ප්‍රධාන ඇමතිවරයා ලෙස සේවය කළේය.

(B) රජතුමාගේ හා මධ්‍යම ආණ්ඩුවේ බලය වර්ධනය කිරීමට පියවර ගත්තේ ය.

(C) රදළ ප්‍රභූවරුන්ගේ බලකල හා වරප්‍රසාදවලට ප්‍රහාර එල්ල කළේ ය.

(D) හියුගනොට්වරුන්ට අනුග්‍රහ දැක්විය. (.........)

**29.** ආදි තන්ත්‍රය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ආදි තන්ත්‍රය යටතේ ප්‍රංශ සමාජය ප්‍රජා ගණ තුනකට බෙදී පැවතුණි.

(B) ආදි තන්ත්‍රය යටතේ සමූහාණ්ඩු පාලනයක් පැවතුණි.

(C) පූජක පන්තිය හා රදළ පන්තිය යන දෙපිරිසම විශේෂ වරප්‍රසාද භුක්ති වින්දාහ.

(D) ප්‍රංශය හා එංගලන්තය අතර අත්සන් කරන ලද ඊඩන් ගිවිසුම ප්‍රංශ ආර්ථිකය වැඩි දියුණු කිරීමට ආධාර විය. (.........)

**30.** කුළුණු යුද්ධය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) අමෙරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය අතර පැවති දේශපාලන හා දෘෂ්ටිවාදීමය ගැටුම 'කුළුණු යුද්ධය' යනුවෙන් හඳුන්වනු ලැබේ.

(B) 1949 දී උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය පිහිටුවන ලදී.

(C) 1955 දී වෝර්සෝ සම්මුතිය අත්සන් කරන ලදී.

(D) 1989 දෙසැම්බර් මස අමෙරිකානු හා රුසියානු නායකයෝ "කුළුණු යුද්ධය" නිල වශයෙන් අවසන් බව ප්‍රකාශ කළහ. (.........)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**31.** මිලාන් ආඥාව ප්‍රකාශයට පත් කරන ලද්දේ කුමන රෝම අධිරාජයා විසින් ද?

(1) මාකස් අවුරේලියස් (2) ඩයක්ලීෂියන් (3) වැලේරියන්

(4) කොන්ස්ටන්ටයින් (5) තියඩෝසියස් (.........)

**32.** තිස් අවුරුදු යුද්ධය නිමාවට පත්කළ සාම ගිවිසුම කුමක් ද?

(1) ඔග්ස්බර්ග් සාම ගිවිසුම (2) පැරිස් සාම ගිවිසුම

(3) ඇමියන්ස් සාම ගිවිසුම (4) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම

(5) රෝම සාම ගිවිසුම (.........)

**33.** උපයෝගිතාවාදය සවිස්තරාත්මකව අර්ථ දක්වන ලද්දේ කවුරුන් විසින් ද?

(1) තෝමස් මෝල්තස් (2) ඩේවිඩ් රිකාර්ඩෝ (3) ජෙරමි බෙන්තම්

(4) රොබට් ඕවන් (5) ෆ්‍රෙඩ්රික් එන්ගල්ස් (.........)

**34.** සත් සති යුද්ධය ඇති වූයේ කුමන රටවල් අතර ද?

(1) ප්‍රංශය හා එංගලන්තය (2) රුසියාව හා තුර්කිය

(3) ඔස්ට්‍රියාව හා සාර්ඩිනියාව (4) ඔස්ට්‍රියාව හා ප්‍රශියාව

(5) ප්‍රංශය හා ප්‍රශියාව (.........)

**35.** සියලු මිනිසුන් වෙත ඉහළම සෞඛ්‍ය මට්ටමක් අත්පත් කර දීමේ පුළුල් අරමුණෙන් යුතුව පිහිටුවා ඇති එක්සත් ජාතීන්ගේ විශේෂිත ඒජන්සිය කුමක් ද?

(1) ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)

(2) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)

(3) ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)

(4) එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)

(5) එක්සත් ජාතීන්ගේ සහන හා වැඩ ඒජන්සිය (UNRWA) (.........)

[ හයවෙනි පිටුව බලන්න.



Department of Examinations - Sri Lanka

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | පුරාණ ග්‍රීකයෝ විශ්වයේ වඩාත්ම වැදගත් සත්වයා ලෙස මනුෂ්‍යයා උත්කර්ෂයට නැංවූහ. | ක්‍රි. පූ. අටවන සියවසේ දී හෝමර්, ලයිසියම් නම් පාසැලක් ආරම්භ කරන ලදැයි විශ්වාස කෙරේ. | (.........) |
| **37.** | දේව වරම්වාදය යනු රජවරුන් දෙවියන් වහන්සේට පමණක් වගකිව යුතුය යනුවෙන් ප්‍රකාශ කළ මතවාදයකි. | දාහත්වන සියවසේ දෙවන භාගයේ ප්‍රංශයේ දාහතරවන ලුවී රජුගේ රාජාණ්ඩුව දේව වරම්වාදී සිද්ධාන්තය මත පදනම්ව පැවතුණි. | (.........) |
| **38.** | ස්වකීය ජනතාවගේ ආගම ලෙස ලූතර් දහම හෝ කතෝලික දහම හෝ තෝරා ගැනීමට සෑම ජර්මන් කුමාරයෙකුටම නිදහස ඇතැයි නැන්ට්ස් ආඥාවෙන් නියම කෙරිණි. | 1806 දී නැපොලියන් බොනපාට් ශුද්ධ රෝම අධිරාජ්‍යය අහෝසි කළේය. | (.........) |
| **39.** | විප්ලව වර්ෂය ලෙස හැඳින්වෙන එක්දහස් අටසිය හතලිස් අට නූතන යුරෝපා ඉතිහාසයේ සන්ධිස්ථානයක් වශයෙන් සැලකිය හැකිය. | එක්දහස් අටසිය හතලිස් අට, ප්‍රංශ විප්ලවයෙන් ආරම්භ වූ විප්ලව සමයේ අවසානයත්, යුරෝපයේ රටවල් කීපයකම සාර්ථක ජාතික සටන් ව්‍යාපාරවල ආරම්භයත් සලකුණු කරයි. | (.........) |
| **40.** | ලන්ඩන් ගිවිසුම, යුරෝපා ආර්ථික සංගමය පිහිටුවිය. | 1949 දී චාල්ස් ඩි ගෝල් ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ පළමුවන චාන්සලර්වරයා බවට පත්විය. | (.........) |

* *



Department of Examinations - Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021(2022)

විෂයය අංකය / பாட இலக்கம்: **25 B**

විෂයය / பாடம்: **යුරෝපා ඉතිහාසය**

## ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 5 | 31. | 4 |
| 02. | 5 | 12. | 5 | 22. | 4 | 32. | 2 |
| 03. | 1 | 13. | 2 | 23. | 3 | 33. | 3 |
| 04. | 4 | 14. | 2 | 24. | 2 | 34. | 4 |
| 05. | 1 | 15. | 3 | 25. | 5 | 35. | 2 |
| 06. | 2 | 16. | 5 | 26. | 1 | 36. | 1 |
| 07. | 3 | 17. | 4 | 27. | 5 | 37. | 2 |
| 08. | 2 | 18. | 1 | 28. | 3 | 38. | 4 |
| 09. | 5 | 19. | 4 | 29. | 2 | 39. | 5 |
| 10. | 4 | 20. | 1 | 30. | 5 | 40. | 3 |

✪ විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින් / புள்ளி வீதம்
මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 1 × 40 = 40



Department of Examinations - Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021 (2022)

## ඉතිහාසය II (II කොටස)

### යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා

උපදෙස්:

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නයටත්, B හා C කොටස්වලින් අවම වශයෙන් එක ප්‍රශ්නය බැගින් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
  (පළමුවැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා යුරෝපයේ දළ සිතියමක් සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) මධ්‍යධරණී මුහුද  (ii) ක්‍රීට්  (iii) රෝමය
(iv) ඩැනියුබ් ගඟ  (v) කැස්පියන් මුහුද  (vi) පෝ ගඟ
(vii) බොස්පරස් සමුද්‍ර සන්ධිය  (viii) පෝලන්තය  (ix) ජිනීවා
(x) නෝර්වේ  (xi) ලිවර්පූල්  (xii) ඩැන්සිග්

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)*

Department of Examinations - Sri Lanka

AL/2021(2022)/25 B/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | | |
|---|---|---|---|
| යුරෝපා ඉතිහාසය | II | 25 B | S |
| ஐரோப்பிய வரலாறு | II | | |
| History of Europe | II | | |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **1**

විභාග අංකය / சுட்டெண் / Index No. ...........................




Department of Examinations - Sri Lanka

## B කොටස

**2. පෞර රාජ්‍යයක සිට විශාල අධිරාජ්‍යයක් දක්වා රෝම බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න.**

- ක්‍රි. පූ. 7 වන සියවස ඉතාලි අර්ධද්වීපයේ මධ්‍ය කොටසට වන්නට, ටයිබර් ගඟ අසබඩ ආරක්ෂිත ස්ථානයක කුඩා ලතින් රාජ්‍යයක් ලෙස රෝම පෞර රාජ්‍යය ස්ථාපනය විය.

- බල ව්‍යාප්තියේ මූල්ම අවස්ථාව, රෝමය ලතින් රාජ්‍යවල ප්‍රධානත්වය ගනිමින් එකී රාජ්‍යවල ආරක්ෂකයා වශයෙන් පෙනී සිටීම හා උතුරු ඉතාලි ප්‍රදේශවල බලය ව්‍යාප්ත කිරීමයි.
  - ක්‍රි. පූ. 395 වනවිට එට්රස්කන්වරුන් ජයගැනීම.
  - ක්‍රි. පූ. 343-275 අතර සැම්නයිට් යුද්ධ (මෙය හුදෙක් සැම්නයිට්වරුන් සමග පමණක් නොව උතුරේ ලතින් රාජ්‍ය, ගෝල්වරුන්, දකුණේ ග්‍රීකයන් මෙන්ම ලතින් රාජ්‍යවල සහායට පැමිණි මැසිඩෝනියානු හමුදා සමග පවා සටන් කළ කාලයකි). අවසානයේ ක්‍රි. පූ. 275 වනවිට පෝ නදියෙන් බැහැර සමස්ත ඉතාලියම රෝම බලයට නතුවීම.

- බල ව්‍යාප්තියේ දුෂ්කර හා වැදගත්ම අවස්ථාව, ක්‍රි. පූ. 264-202 අතර කාතේජය සමග කරන ලද පියුනික් යුද්ධ විය.

  කාතේජය කෙලින්ම ඈඳා නොගත් නමුත් සිසිලිය, සාර්ඩීනියාව, කෝසිකාව යටත් වූ අතරම ස්පාඤ්ඤයත් රෝම පාලනයට නතුවීම.

- මීළඟ අවස්ථාව ක්‍රි. පූ. 197 සිට 146 දක්වා දකුණේ ග්‍රීක පෞර රාජ්‍යවල ව්‍යාප්ත වීම.

  මුලදී මැසිඩෝනියානු ආධිපත්‍යය හමුවේ ඇතැම් රාජ්‍යවල ආරක්ෂකයා වශයෙන් පෙනී සිටීම; ග්‍රීක පෞර රාජ්‍ය අතර අර්බුදවලට මැදිහත් වීම; අවසානයේ ඒවා යටත් කොට ඈඳා ගැනීම.

- ක්‍රි. පූ. 146 න් පසු සිසිලිය, සාර්ඩීනියා, කෝසිකාව, ස්පාඤ්ඤය (පළාත් 2ක් වශයෙන්), මැසිඩෝනියාව හා අප්‍රිකාව වශයෙන් විශාල ප්‍රදේශයක දකුණට හා බටහිරට ව්‍යාප්තවීම.

- එසේම උතුරින් ගෝල්වරුන් පරාජය දක්වාත් එතැන් සිට බ්‍රිතාන්‍ය දූපත් දක්වාත් බලය ව්‍යාප්ත කොට තිබීම.

***(ලකුණු 16 යි)***



Department of Examinations - Sri Lanka

3. **'පුනරුදය මූලික වශයෙන් සංස්කෘතික ව්‍යාපාරයකි.'**

**(i) පුනරුදය ආරම්භ වූ රට නම් කරන්න.**

ඉතාලිය

*(ලකුණු 01 යි)*

**(ii) පුනරුදයට අනුග්‍රහ දැක්වූවන් දෙදෙනෙකු නම් කරන්න.**

පවුල්: මිලානෝහි ස්ෆෝර්සා, ෆ්ලෝරන්හි මෙඩිචි, ෆෙරාරාහි එස්ටේ, මාන්ටුවාහි ගොන්සාගා

පුද්ගලයන්: IV නිකලස්, VI ඇලෙක්සැන්ඩර්, II ජූලියස්, X ලියෝ යන පාප්වරු

*(ලකුණු 02 යි)*

**(iii) පුනරුදය ඇතිවීමට තුඩුදුන් සාධක සැකෙවින් දක්වන්න.**

ඉතාලියෙන් පුනරුදය ඇතිවීමට අභ්‍යන්තර මෙන්ම බාහිර සාධකද බලපා ඇත.

❖ අභ්‍යන්තර සාධක

- ඉතාලියේ ආර්ථික, සමාජ හා දේශපාලන පසුබිම:
  1. වැඩවසම් ක්‍රමය පිරිහී තිබීම
  2. වෙළෙඳාම දියුණුව පැවතීම
  3. වෙළෙඳ නගර වර්ධනය වීම
  4. ධනවත් මධ්‍යම පංතියක් බිහිවීම හා ඔවුන්ගේ අනුග්‍රහය ලැබීම
  5. ඉතාලියේ පෞර රාජ්‍යවල සිටි කුමාරවරු සහ ඇතැම් පූජකයන් කලා කටයුතුවලට අනුග්‍රහය දැක්වීම
- බටහිර යුරෝපයේ අන් කිසිදු රටක දක්නට නොලැබුණු අන්දමේ සම්භාව්‍ය සම්ප්‍රදායක් ඉතාලියේ ශේෂව පැවතීම.
- පැරණි රෝම ශිෂ්ටාචාරයේ ස්මාරක ශේෂව පැවතීම.
- ඉතාලියේ විශ්ව විද්‍යාලවල දේවධර්මයට වඩා නීතිය, වෛද්‍ය විද්‍යාව වැනි විෂයයන් හැදෑරීමට නැඹුරු වීම. මේ නිසා ලෞකිකත්වය හා තර්කනයට වැඩි අවකාශයක් පැවතීම.

❖ බාහිර සාධක

1453 කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අතට පත්වීම හේතුකොටගෙන එහි තිබූ ග්‍රීක-රෝම පොත පත රැගෙන උගතුන් ඉතාලියට පලායාම - ග්‍රීක-රෝම දැනුම ඉතාලියට සම්ප්‍රේෂණය වීම.

*(ලකුණු 05 යි)*

Department of Examinations - Sri Lanka

**(iv) කලාව, භාෂා සහ සාහිත්‍යය යන ක්ෂේත්‍රවල පුනරුදයේ කාර්ය සිද්ධීන් කෙරෙහි අවධානය යොමු කරමින් සංස්කෘතික ව්‍යාපාරයක් ලෙෂ එහි ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.**

❖ කලාව

- කලාව සම්බන්ධයෙන් ප්‍රබෝධයක් ඇති වීම. මෙහි දී ගෘහ නිර්මාණ ශිල්පය හා ප්‍රතිමා කලාව සම්බන්ධයෙන් සඳහා ග්‍රීක-රෝම සම්ප්‍රදායේ ආභාසය ලැබීම.
- චිත්‍ර කලාවේ විශාල ප්‍රබෝධයට ඇති වීම. ෆ්ලෝරන්ස් නගරය චිත්‍ර කලාවේ කේන්ද්‍රස්ථානය වීම.
- ප්‍රකට පුනරුද කලාකරුවෝ සහ කලාකෘති.
- ඩොනෙටෙලෝ (ඩේවිඩ්), මයිකලාන්ජෙලෝ (ඩේවිඩ්, මෝසෙස්, පියේටා, සිස්ටයින් දේවස්ථානයේ සිවිලිමේ ඇති චිත්‍ර), ජියෝටෝ (මැඩෝනා), මසත්ෂියෝ (ආදම් සහ ඒව), බොටිචෙලි (වීනස්ගේ උපත), ලියනාඩෝ ඩා වින්චි (මොනාලිසා, අවසන් රාත්‍රී භෝජන සංග්‍රහය)

❖ භාෂා හා සාහිත්‍යය

- ග්‍රීක හා ලතින් භාෂාවල ප්‍රබෝධයක් ඇති වීම. භාෂා හා මානව ශාස්ත්‍ර හැදෑරීම වර්ධනය වීම.
- මානවවාදයේ නැගී ඒම හා මානවවාදී ගත්කතුවරුන් බිහිවීම හේතුකොටගෙන සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති වීම.
  ෆ්‍රැන්සිස් පෙට්රාක්, ඩාන්ටේ අලිගියරි, ගියෝවන්ති බොකෑෂියෝ

*(ලකුණු 08 යි)*

4. **පහත දැක්වෙන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් අමෙරිකන් විප්ලවය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරන්න.**

**(i) විප්ලවය ඇති වූ පසුබිම**
**(ii) ඉන් උද්ගත වූ ප්‍රතිඵල**

**(i) විප්ලවය ඇති වූ පසුබිම**

❖ ආර්ථික සාධක

- එංගලන්තය අමෙරිකාවේ ඉංග්‍රීසි ජනපද සම්බන්ධයෙන් අනුගමනය කළ වාණිජවාදී ප්‍රතිපත්තිය. එහි ප්‍රධාන අරමුණ වූයේ අමෙරිකානු ජනපද තම නිෂ්පාදන සඳහා වෙළඳපොළක් ලෙස මෙන්ම තම පරිභෝජනයට හා කර්මාන්ත සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නිපදවන ස්ථාන ලෙස තබාගැනීමයි.

Department of Examinations - Sri Lanka

- එංගලන්තයේ මෙම ප්‍රතිපත්තිය නාවික පනත් හා වාණිජ නීති මගින් ක්‍රියාත්මක වීම:
  - ✓ එංගලන්තයේ නිපදවන ඇතැම් භාණ්ඩ ජනපදවල නිපදවීම තහනම් කිරීම.
  - ✓ 'නම් කළ භාණ්ඩ' ලෙස හැඳින්වූ භාණ්ඩ එංගලන්තයට පමණක් අලෙවි කළ යුතු යයි නියම කිරීම (දුම්කොළ, කපු, සීනි).
  - ✓ ජනපදවලින් ලබාගත් අමුද්‍රව්‍යවලින් එංගලන්තයේදී නිෂ්පාදනය කරන ලද භාණ්ඩ, එංගලන්තය විසින් නියම කරන ලද මිල ගණන්වලට ජනපදවාසීන්ට අලෙවි කිරීම.
  - ✓ ජනපදවල භාණ්ඩ ප්‍රවාහනය, එංගලන්තයට අයත් නැව්වලින් පමණක් කළ යුතු බව නියම කිරීම.

යටත් විජිතවාසීහු මෙම ආර්ථික ප්‍රතිපත්තියට දැඩි සේ විරුද්ධ වූහ.

❖ දේශපාලන සාධක:

- එංගලන්තයේ පාර්ලිමේන්තුව විසින් ජනපදවලින් බදු අය කරගනු ලැබීම පිළිබඳව ජනපදවාසීන් තුළ පැවති විරෝධය, ක්‍රමයෙන් එංගලන්තයේ පාලනයෙන් දේශපාලන නිදහස ලබාගන්නා ක්‍රියාමාර්ගයක් බවට පරිවර්තනය වීම.
- සත් අවුරුදු යුද්ධයෙන් (1756-1763) පසු ඉංග්‍රීසි ජනපදවලට තිබූ ප්‍රංශ තර්ජනය මෙන්ම රතු ඉන්දියානු තර්ජනය ඉවත් වූ නිසා ඉංග්‍රීසි හමුදාවල ආරක්ෂාව පෙර පරිදි ජනපදවාසීන්ට අවශ්‍ය නොවීම.
- එහෙත් ඉංග්‍රීසි පාර්ලිමේන්තුව, අමෙරිකාවේ තිබූ ජනපදවාසීන්ගේ නියෝජිතයන්ගෙන් යුත් ව්‍යවස්ථාදායක සභාවල අනුමැතියකින් තොරව, ඉංග්‍රීසි හමුදාවල නඩත්තුවට යයි ප්‍රකාශ කරමින් නව බදු පැනවීම. ටවුන්ෂෙන්ඩ් පනත්, වීදුරු බද්ද, මුද්දර බද්ද, තේ බද්ද ආදිය පැනවූවා පමණක් නොව ඒවා දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමටද උත්සාහ ගැනීම.
- ජනපදවාසීන්ගේ උද්ඝෝෂණය හමුවේ ඇතැම් බදු අවලංගු කරන ලද නමුත්, ජනපදවලින් බදු අයකිරීමේ අයිතිය ඉංග්‍රීසි පාර්ලිමේන්තුවට තිබෙන බව ප්‍රකාශ කරමින් තේ බද්ද පමණක් අවලංගු නොකිරීම.
- එහෙත් ඉංග්‍රීසි පාර්ලිමේන්තුවට ඇති එම අයිතිය ප්‍රතික්ෂෙප කළ ජනපදවාසීන්, බොස්ටන් වරායේ තිබූ තේ පෙට්ටි තොගයක් මුහුදට විසිකොට (බොස්ටන් තේ සාදය) 'නියෝජනයක් නැතිනම් බදුත් නැත' යන සටන් පාඨය යටතේ අමෙරිකානු නිදහස් සටන 1775 දී ආරම්භ කිරීම.
- 1775 දී දෙපක්ෂය අතර ගැටුම් ඇතිවීම; 1776 ජූලි 4 දා ජනපදවාසීන් අමෙරිකානු ස්වාධීනතා ප්‍රකාශනය නිකුත් කිරීම. 1783 දී ජනපදවාසීන් එංගලන්ත හමුදා පරාජය කොට, අමෙරිකා නිදහස් සටන ජයගැනීම.

***(ලකුණු 08 යි)***

Department of Examinations - Sri Lanka

**(ii) ඉන් උද්ගත වූ ප්‍රතිඵල**

- ❖ නිදහස් සටන ජයගැනීමෙන් පසු අමෙරිකා එක්සත් ජනපදය නම් ස්වාධීන රාජ්‍යය බිහිවීම.
- ❖ පළමුවන බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අවසානය සලකුණු කිරීම හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය ප්‍රතිපත්තිය වෙනස් වීම.
- ❖ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට විරුද්ධව සටන්කොට ස්වාධීනත්වය දිනාගත් ප්‍රථම රාජ්‍යය බවට අමෙරිකා එක්සත් ජනපදය පත්වීම.
- ❖ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පිළිගත් ෆෙඩරල් සමූහාණ්ඩුවක් ඇතිවීම
- ❖ මූලික මිනිස් අයිතිවාසිකම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම සම්පාදකයන් සැලකිලිමත් වීම.
- ❖ පසුකාලීන දේශපාලන සිදුවීම් හා සංවර්ධනයන් කෙරෙහි බලපෑම. නිදර්ශන: ප්‍රංශ විප්ලවය, දකුණු අමෙරිකාවේ ස්පාඤ්ඤ හා පෘතුගීසි විරෝධී නිදහස් සටනේ ව්‍යාපාර.
- ❖ ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රමය බිහිවීම.
- ❖ අමෙරිකානු නිදහස් සටන ප්‍රංශ විප්ලවය ඇතිවීම කෙරෙහි බලපෑම.

*(ලකුණු 08 යි)*

5. **පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.**

**(i) ග්‍රීක ආගම හා දර්ශනය**

**(ii) හත්වන හෙන්රි හෝ අටවන හෙන්රි හෝ යටතේ එංගලන්තය**

**(iii) එංගලන්තයේ කාර්මික විප්ලවය ඇති වූ පසුබිම**

**(iv) නැපෝලියන් බොනපාට්ගේ දේශීය ප්‍රතිපත්තිය**

*(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගින්)*

**(i) ග්‍රීක ආගම හා දර්ශනය**

ආගම:

- ❖ බහුදේවවාදයක් පැවතීම.
- ❖ දේව පරපුරක් පිළිබඳව විශ්වාස කිරීම. සියුස් (ආකාශ දෙවියා) ප්‍රධාන කොටගත් දේව මණ්ඩලය.
- ❖ ග්‍රීක දෙවිවරුන් අතර කිසියම් ආකාරයක ධුරාවලියක් දක්නට ලැබීම. එමෙන්ම ඔවුන් අතර ඥාතීත්වයක් ද පැවති බව විශ්වාස කිරීම.
  - ▪ සියුස් - අහසට අධිපති (දෙවියන් අතර ප්‍රධානියා)
  - ▪ හෙරානා - සියුස් දෙවියාගේ බිරිඳ
  - ▪ ඇතීනා - ප්‍රඥාවට අධිපති (සියුස් දෙවියන්ගේ දියණිය)
  - ▪ ඒරිස් - යුද්ධයට අධිපති (හෙරානාගේ පුත්‍රයා)
  - ▪ හර්කියුලිස් - ලෝකය උසුලාගෙන සිටින්නා (සියුස් දෙවියාගේ පුත්‍රයා)
  - ▪ ඇපලෝ - සූර්ය දෙවියා (සියුස් දෙවියාගේ පුතා)
  - ▪ පොසයිඩන් - සමුද්‍රයට අධිපති සියුස් ගේ සහෝදරයා
  - ▪ ඇෆ්‍රඩයිට් - ආලයට අධිපති
  - ▪ ආටිමිස් - සඳ දෙවියා (දඩයමට අධිපති



Department of Examinations - Sri Lanka

- ❖ දෙවිවරුන් ඔලිම්පස් කන්දේ වාසය කරතැයි විශ්වාස කිරීම.
- ❖ සෑම පෞර රාජ්‍යයකටම පාහේ අධිපති දෙවියෙකු හෝ දේවතාවියක සිටීම.
    - සියුස් - ඔලිම්පියා
    - ඇතීනා - ඇතැන්ස්
    - ඇපලෝ - ඩෙල්ෆි
    - ඇෆ්‍රඩයිට් - කොරින්ත්
- ❖ ස්වභාවික වස්තූන්ට දේවත්වය ආරූඪකොට වැදුම් පිදුම් කිරීම. එහෙත් ග්‍රීකයන් තුළ දෙවියන් කෙරෙහි පැවති බිය බොහෝ දුරට අඩුව තිබීම.
- ❖ බිලි පූජා පැවැත්වීම හා පේන කීම (ඩෙල්ෆි).
- ❖ ආගමික එක්සත් භාවයක් පැවතීම.
- ❖ ග්‍රීක ආගම නිදහස් චින්තනයට බාධාකාරී නොවීම.
- ❖ විවිධ කලාවන්ගේ දියුණුවට ආගමෙන් අනුබල ලැබීම. (දේවස්ථාන ඉදිවීම, පාර්තිනොන්)

<u>දර්ශනය:</u>

- ❖ ග්‍රීක ශිෂ්ටාචාර අවධියේ ඉතාමත්ම වැදගත් විෂය ක්ෂේත්‍රය ලෙස සැලකුණේ දර්ශනයයි.
- ❖ දර්ශනයට විෂයයන් ගණනාවක් අයත් විය (භෞතික විද්‍යාව, තාරකා විද්‍යාව, තර්ක ශාස්ත්‍රය ආදිය).
- ❖ තර්කානුකූලව හා බුද්ධිවාදී ලෙස ස්වභාව ධර්මය හා මානව සමාජය අධ්‍යයනය කිරීමට යත්න දරා තිබීම ග්‍රීක දර්ශනයේ දැකිය හැකි විශේෂ ලක්ෂණයයි.
- ❖ මුල්කාලීන - දාර්ශනිකයන් තේලීස්, ඇනෙක්සිමැන්ඩර්, ඇනෙක්සිමීනීස්.
- ❖ විතණ්ඩවාදීන්.
- ❖ සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල්.

*(ලකුණු 08 යි)*



Department of Examinations - Sri Lanka

**(ii) හත්වන හෙන්රි හෝ අටවන හෙන්රි හෝ යටතේ එංගලන්තය**

හත්වන හෙන්රිː

1485 බොස්වර්ත් සටන ජයග්‍රහණය කළ ලැන්කැස්ට්‍රියන් පෙළපතේ හෙන්රි ලැන්කැස්ට්‍රියන් හා යෝර්ක් පෙළපත් අතර පැවති රෝස යුද්ධ අවසන් කිරීම.

- ❖ රෝස යුද්ධ ජයග්‍රහණය කිරීමෙන් පසු එංගලන්තයේ රජ වීම.
- ❖ ටියුඩර් නමින් නව රාජවංශයක් ඇරඹීම.
- ❖ යෝර්ක් පෙළපතට අයත් එළිසබත් විවාහ කරගෙන එංගලන්තය තුළ එක්සත් රාජ්‍යයක ගොඩනැගීම.
- ❖ රදළ බලය බිඳදැමීමට ක්‍රියාකිරීම.
  - ✓ පෞද්ගලික නිලකාර හමුදා තහනම් කිරීම.
  - ✓ ස්ටාර් චේම්බර් නම් විශේෂ අධිකරණයක් පිහිටුවීම.
- ❖ මධ්‍යම පන්තිකයන් ප්‍රිවි කවුන්සිලය හා වෙනත් අධිකරණ මණ්ඩලවලටත් ආණ්ඩුවේ ඉහළ තනතුරු වලටත් පත් කිරීම.
- ❖ පාර්ලිමේන්තුව රජුට අවනත හා යටත් ආයතනයක් බවට පත් කරගැනීම.
- ❖ වෙඩි බෙහෙත් පිළිබඳව තනි අයිතිය රජු වෙත ලබාගැනීම.
- ❖ විවාහ සම්බන්ධතා මගින් බලය තහවුරු කරගැනීම.
  - ✓ යෝර්ක් පෙළපතට අයත් එළිසබෙත් විවාහ කරගැනීම.
  - ✓ ස්පාඤ්ඤයේ ෆර්ඩිනන්ඩ්-ඉසබෙලාගේ දියණිය වූ කැතරින් කුමරිය තම වැඩිමහල් පුතු වූ ආතර් කුමරුට විවාහ කරදීම. ආතර් මිය ගිය පසු එම කුමරිය තම දෙවෙනි පුතු වූ හෙන්රිට විවාහ කරදීම.
  - ✓ ස්කොට්ලන්තයේ හතර වන ජේම්ස් රජුට තම දියණිය වූ මාග්‍රට් විවාහ කරදීම.
- ❖ ආර්ථිකය ශක්තිමත් කිරීමට පියවර ගැනීම.
  - ✓ ලෝම වෙළඳාම දියුණු කිරීම සඳහා බර්ගන්ඩිය සමඟ 1506 දී වෙළඳ ගිවිසුමක් ඇතිකරගැනීම.
- ❖ දේශගවේෂණයට අනුග්‍රහ දැක්වීම.

***(ලකුණු 08 යි)***

අටවන හෙන්රි

- ❖ ආගමික ස්වාධීනත්වය ලබාගැනීම.
- ❖ මුලදී රෙපරමාදු ආගම පිළිනොගැනීම.
- ❖ පාප්තුමා සමග සමීප සබඳතා පැවැත්වීම.
  (ලියෝ පාප්තුමා සමයාරක්ෂක නම් ගෞරව නාමය ලබාදීම)
- ❖ ක්ලෙමන්ට් පාප්තුමා 'ගෝල්ඩන් රෝස්' යන නම්බු නාමය රජුට පිදීම. එහෙත් දික්කසාදය ලබා ගැනීමට පාප්තුමා අවසර නොදීම හේතුකොටගෙන රජු රෙපරමාදු ආගම වැළඳ ගැනීම.
- ❖ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන කැතරින් බිසව දික්කසාද කොට ඈන් බොලින් විවාහ කර ගැනීම.
- ❖ ක්‍රිස්තු සභාවට හිමි වූ ආදායම් මාර්ග අහුරා එම ආදායම ජාතික රාජ්‍යයේ උන්නතියට යෙදවීම.
- ❖ රෝමයට අභියාචනා ඉදිරිපත් කිරීම තහනම් කිරීම.
- ❖ පාප්තුමාගේ ආධිපත්‍යයෙන් එන්ගලන්තය මුදවා ගැනීම.
- ❖ එංගලන්ත ආගමික සභාවේ ප්‍රධානියා ලෙෂ තමාව පත් කරගැනීම හා පාර්ලිමේන්තුවෙන් ඊට අනුමැතිය ලබාගැනීම.
- ❖ පාර්ලිමේන්තුව රජුට අවනත ආයතනයක් බවට පත් කර ගැනීම.

***(ලකුණු 08 යි)***

Department of Examinations Sri Lanka

**(iii) එංගලන්තයේ කාර්මික විප්ලවය ඇති වූ පසුබිම**

- ❖ එංගලන්තයේ විදේශ වෙළඳාම පුළුල් වී යාම.
- ❖ භාණ්ඩ ඉල්ලුම වැඩි වීම හා නිෂ්පාදනය පුළුල් කර ගැනීමේ අවශ්‍යතාව මතුවීම.
- ❖ එංගලන්තය තුළ විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය හා දැනුම වර්ධනය වී තිබීම.
- ❖ වෙළඳාම වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මූලධනයක් උපයාගෙන සිටි ධනවතුන් පිරිසක් බිහිවී සිටීම.
- ❖ කෘෂිකාර්මික විප්ලවය (දෙවැනි ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය) නිසා ඉඩම් අහිමි හා රැකියා විරහිත පිරිසක් බිහිවී සිටීම හා ඔවුන් රැකියා සොයා නගරවලට සංක්‍රමණය වීම.
- ❖ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි වීම.

*(ලකුණු 08 යි)*

**(iv) නැපෝලියන් බොනපාට්ගේ දේශීය ප්‍රතිපත්තිය**

- ❖ ස්වකීය බලය තහවුරු වන අන්දමේ ආණ්ඩුක්‍රමයක් පිහිටුවාගැනීම හා ජනමත විචාරණ මගින් තම ක්‍රියාමාර්ගවලට ජනතා කැමැත්ත ලබාගැනීම.
- ❖ පරිපාලන ඒකාබද්ධතාවක් ඇති කිරීම. පළාත් පාලනය විධිමත් කිරීම හා ඒ සඳහා ප්‍රිෆෙක්ට්වරුන් පත්කිරීම.
- ❖ සාධාරණ බදු ක්‍රමයක් හා හැකියාවට හා දක්ෂතාවට අනුව තනතුරුවලට පත්කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- ❖ පාප් වහන්සේ සමග එකඟතාවක් ඇතිකරගෙන කතෝලික සභාව හා රජය අතර පැවති ගැටුම සමථයකට පත් කිරීම.
- ❖ නැපෝලියානු නීති සංග්‍රහය මගින් ප්‍රංශයට ඒකීය නීති ක්‍රමයක් ලබාදීම. ප්‍රංශ විප්ලවයේ මූලික ප්‍රතිපත්ති ගණනාවක් එයට ඇතුළත් කිරීම.
- ❖ විප්ලව සමයේ ආරම්භ කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යමින් සෑම ප්‍රධාන නගරයකම ලයිසීස් හෙවත් උසස් පාඨශාලා හා ගුරුවරුන් පුහුණු කිරීම සඳහා පැරිසියේ පාසැලක් පිහිටුවීම. පැරිසියේ ජාතික විශ්වවිද්‍යාලයක් පිහිටුවීම.
- ❖ ප්‍රංශය ශක්තිමත් කිරීමට ආධාර වන මූල්‍ය හා ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.

*(ලකුණු 08 යි)*

## C කොටස

**6. වික්ටර් එමැනුවෙල් රජු, කැවූර් හා ගැරිබෝල්ඩි යන්නවුන්ගේ භූමිකා අගයමින්, 1848 සිට 1870 දක්වා වූ කාලය තුළ ඉතාලිය එක්සත් කිරීමේ ප්‍රධාන අවස්ථා පරීක්ෂා කරන්න.**

- ❖ වික්ටර් එමැනුවෙල් රජු, කැවූර් හා ගැරිබෝල්ඩි යන නායකයන් තිදෙනා ඉතාලි එක්සත් ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා තුනක් නියෝජනය කරති.
- ❖ වික්ටර් එමැනුවෙල් රජු:
  - ▪ පීඩ්මොන්ට්-සාර්ඩීනියා රාජ්‍යය තුළ නිදහස් ආණ්ඩුක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
  - ▪ අගමැතිවරයා වශයෙන් කැවූර් පත් කිරීම හා ඔහුගේ ක්‍රියාමාර්ගවලට අනුග්‍රහය සහ සහයෝගය දැක්වීම.



Department of Examinations - Sri Lanka

- කැවූර් :
  - 1852 සිට 1861 දක්වා කාලයේදී පීඩ්මොන්ට්-සාර්ඩීනියා රාජ්‍යයේ අගමැතිවරයා වශයෙන් එය ශක්තිමත් රාජ්‍යයක් බවට පත්කිරීමට කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම. එතුළින් එම රාජ්‍යය ඉතාලිය එක්සත් කිරීමේ නායකත්වය ගැනීමට සුදුසු තත්ත්වයට පත්කිරීම.
  - එක්සත් කිරීමේ මුල්ම පියවර ලෙස ඉතාලියේ පැවති ඔස්ට්‍රියානු ආධිපත්‍යය පරාජය කිරීමට විදේශ ආධාර ලබාගත යුතු බව අවබෝධ කරගෙන ඒ සඳහා ප්‍රංශයේ ආධාර ලබාගැනීමට කටයුතු කිරීම.
  - ප්‍රංශ ආධාර ඇතිව ඔස්ට්‍රියාවට එරෙහි සටනින් එක්සත් කිරීමේ ව්‍යාපාරය ආරම්භ කිරීම. ලොම්බාර්ඩිය පීඩ්මොන්ට්-සාර්ඩීනියා රාජ්‍යයට ඈඳාගැනීම. පර්මා, මොඩීනා, ටස්කනි හා රොමඤ්ඤා යන රාජ්‍ය පීඩ්මොන්ට්-සාර්ඩීනියා රාජ්‍යයට ඒකාබද්ධ කරගැනීම.
- ගැරිබෝල්ඩි:
  - සිය රතු කමිස හමුදාව උපයෝගිකරගෙන දකුණු ඉතාලියේ තිබූ සිසිලි ද්වයේ රාජ්‍යය බූර්බෝන් පාලකයන්ගෙන් මුදාගෙන පීඩ්මොන්ට්-සාර්ඩීනියා රාජ්‍යය වෙත ලබාදීම.
- 1866 ඔස්ට්‍රියා-ප්‍රෂියා යුද්ධය - වෙනීෂියාව ඈඳාගැනීම.
- 1870 ප්‍රංශ-ප්‍රෂියා යුද්ධය රෝමය අත්පත් කරගැනීම.
- උවසාන අවස්ථා වික්ටර් එමැනුවෙල් රජුගේ මග පෙන්වීම යටතේ සාර්ථක විය.

***(ලකුණු 16 යි)***



Department of Examinations - Sri Lanka

**7. '1917 බොල්ෂෙවික් විප්ලවය රුසියාව තුළ දිගු කාලීන වෙනස්වීම් ඇති කෙළේ ය.'**

**(i) 1917 වන විට රුසියාව පාලනය කළ අවසාන සාර්වරයා නම් කරන්න.**

දෙවන නිකලස්

*(ලකුණු 01 යි)*

**(ii) බොල්ෂෙවික් විප්ලවයේ නායකයන් දෙදෙනෙකු නම් කරන්න.**

වී. අයි. ලෙනින්, ලියොන් ට්‍රොට්ස්කි, ජෝශප් ස්ටාලින්

*(ලකුණු 02 යි)*

**(iii) බොල්ෂෙවික්වරුන්ට රුසියාවේ බලය අල්ලා ගැනීමට තුඩුදුන් සාධක සැකෙවින් දක්වන්න.**

බොල්ෂෙවික්වරුන්ගේ ජයග්‍රහණයට තුඩු දුන් හේතු:

- ❖ සෝවියට් සභා හා තාවකාලික ආණ්ඩුව අතර ඇතිවූ ප්‍රතිවිරෝධතාව.
- ❖ තාවකාලික ආණ්ඩුවේ (මෙන්ෂෙවික්) අකාර්යක්ෂම වීම.
- ❖ පළමුවන ලෝක යුද්ධයේ බලපෑම හේතුකොටගෙන ගොවීන් හා කම්කරුවන් මුහුණදුන් සමාජ-ආර්ථික අර්බුද උත්සන්න වීම. කම්කරුවන්ගෙන් හා ගොවීන්ගෙන් සැදුම්ලත් පීඩිත පන්තිය විප්ලවවාදීන්ට සහාය දීම.
- ❖ රුසියාව පුරා පැතිරුණ වැඩවර්ජන ව්‍යාපාරය.
- ❖ ලෙනින්ගේ හා ට්‍රොට්ස්කිගේ දක්ෂ නායකත්වය.
- ❖ බොල්ෂෙවික්වරුන්ගේ සංවිධාන ශක්තිය.
- ❖ යුද්ධයෙන් පීඩිත හමුදා භටයන්ගේ සහාය බොල්ෂෙවික්වරුන්ට ලැබීම.

*(ලකුණු 04 යි)*

**(iv) 1917 බොල්ෂෙවික් විප්ලවය රුසියාව තුළ දිගුකාලීන වෙනස්වීම් ඇති කළ ආකාරය පරීක්ෂා කරන්න.**

- ❖ ලොව ප්‍රථම සමාජවාදී රාජ්‍යය බිහිකිරීම.
- ❖ බොල්ෂෙවික්වරුන්ට රුසියාව තුළ බහුතර බලයක් නොතිබිණි. මේ නිසා ව්‍යවස්ථා සම්පාදක සභාව විසුරුවා හැර කොමියුනිස්ට් පක්ෂයේ මෙහෙයවීමෙන් යුත් ආණ්ඩුවක් පිහිටුවාගැනීම.
- ❖ ජර්මනිය සමග බ්‍රෙෂ්ට්-ලිටොව්ස්ක් ගිවිසුම අත්සන් කොට යුද්ධයෙන් ඉවත්වීම.
- ❖ විදේශ සහායද ලත් ප්‍රතිවිප්ලවය පරාජය කිරීම.
- ❖ ආර්ථිකය ගොඩනැගීම සඳහා පියවර ගැනීම - නව ආර්ථික ප්‍රතිපත්තිය.

*(ලකුණු 09 යි)*



Department of Examinations - Sri Lanka

**8. අන්තර් යුද්ධ සමය තුළ ජර්මනියෙහි නට්සිවාදය නැගී ඒමට තුඩු දුන් ප්‍රධාන සාධක විග්‍රහ කරන්න.**

- ❖ පළමුවන ලෝක යුද්ධයෙන් පසු ඇඩොල්ෆ් හිට්ලර්ගේ නායකත්වය යටතේ ජර්මන් ජාතික සමාජවාදය හෙවත් නට්සිවාදය නැගී ආවේය.
- ❖ 1919 වර්සායි ගිවිසුමෙන් ජර්මනියට දැඩි දඬුවම් ලබාදීම (උදා: විශාල යුධ වන්දියක් නියම කිරීම; ජර්මනිය සතුව පැවති යටත්විජිත අහිමි කිරීම ආදිය).
- ❖ වෙයිමාර් සමූහාණ්ඩුවේ දුර්වලතා.
- ❖ 1929 ලෝක ආර්ථික අවපාතය හේතුකොටගෙන ජර්මනිය මුහුණදුන් දැඩි ආර්ථික අවපාතය.
- ❖ හිට්ලර්ගේ නායකත්ව පෞරුෂය.
- ❖ ඉතාලි ෆැසිස්ට්වාදයේ ආභාසය ලැබීම.
- ❖ එංගලන්තය හා ප්‍රංශය යන බලවතුන් හිට්ලර්ගේ නැගීම සම්බන්ධයෙන් උදාසීන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
- ❖ ජාතීන්ගේ සංගමයේ අසාර්ථකත්වය.

*(ලකුණු 16 යි)*

**9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.**

**(i) වියනා සම්මේලනය**

**(ii) බිස්මාර්ක්**

**(iii) බෙනිටෝ මුසෝලිනී**

**(iv) 1980 තෙක් සාම සාධක ආයතනයක් ලෙෂ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ භූමිකාව**

*(ලකුණු 08 × 2 = 16)*

(i) වියනා සම්මේලනය

- ♦ නැපෝලියන් බොනපාට් පරාජය කිරීමෙන් පසුව යුරෝපා බලවතුන් වියනාවේ රැස් වූ සම්මේලනය මේ නමින් හැඳින්වීම.
- ♦ අරමුණු :
  - ▪ නැපෝලියන් විසින් අවුල්කරන ලදැයි සැලකුණ යුරෝපා සිතියම යළි සකස්කිරීම.
  - ▪ ප්‍රංශ විප්ලවය ඇතිවීමට පෙර පැවති රජ පෙළපත් හා දේශසීමා නැවත ඇතිකිරීම (නිත්‍යානුකූලවාදය).
  - ▪ බාධක රාජ්‍ය ඇති කිරීම හා බලසමතුලිතතාව.
- ♦ වියනා සමථයේ විධිවිධාන:
  - ▪ ප්‍රංශය - විප්ලවයට පෙර පැවති දේශසීමා යළි පිහිටුවීම; බුර්බෝන් රාජවංශය යළි බලයට පත්කිරීම; යුද වන්දි පැනවීම.
  - ▪ ජර්මනිය - රාජ්‍ය කොටස් ගණන 363 සිට 39 දක්වා අඩුකිරීම.
  - ▪ ඔස්ට්‍රියාව - ලොම්බාර්ඩි හා වෙනීෂියාව ලබාදීම.



Department of Examinations - Sri Lanka

- ප්‍රශියාව - රාජ්‍ය කොටස් ඇඳා පුළුල් කිරීම.
- ඉතාලිය - නිත්‍යානුකූලවාදය තදින්ම ක්‍රියාත්මක වූයේ ඉතාලියේය: ලොම්බාර්ඩිය, වෙනීෂියාව, පීඩ්මොන්ට්-සාර්ඩීනියා, පර්මා, මොඩීනා, ටස්කනි, පාප් රාජ්‍යය, නේපල්ස් හා සිසිලි යනුවෙන් ඉතාලිය කොටස් කර ඒවායේ පැරණි රාජවංශ යළි පිහිටුවීම.

◆ ප්‍රතිඵල:

- ජාතිකවාදය හා ලිබරල්වාදය මර්දනය කිරීමට පෙළඹීම (මෙටර්නික් ක්‍රමය); යුරෝපා සමුළු ක්‍රමය.
- ප්‍රංශයේ දේශසීමා, 1789 ට පෙර පැවති තත්ත්වයට ගෙන ඒම. බූර්බෝන් රාජවංශය යළි බලයේ පිහිටුවීම.
- පෙර පැවති 360 කට අධික රාජ්‍ය කොටස් සංඛ්‍යාව වෙනුවට ජර්මනිය තුළ රාජ්‍ය කොටස් 39 ක් ඇති කිරීම. ජර්මන් සංයුක්තය පිහිටුවීම හා එහි නායකත්වය ඔස්ට්‍රියාවට ලබාදීම.
- ජර්මානු ප්‍රදේශ තුළ ඔස්ට්‍රියාව හා ප්‍රශියාව අතර බලසමතුලිතතාවක් ඇති කිරීම. ඔස්ට්‍රියාවට ලොම්බාර්ඩි හා වෙනීෂියා ලබාදීම හා ප්‍රශියාවට අමතර ප්‍රදේශ ලබාදීම.
- ඉතාලිය - නිත්‍යානුකූලවාදය තදින්ම ක්‍රියාත්මක වූයේ ඉතාලියේය: ලොම්බාර්ඩිය, වෙනීෂියාව, පීඩ්මොන්ට්-සාර්ඩිනියා, පර්මා, මොඩීනා, ටස්කනි, පාප් රාජ්‍යය, නේපල්ස් හා සිසිලි යනුවෙන් ඉතාලිය කොටස් කර ඒවායේ පැරණි රාජවංශ යළි පිහිටුවීම.

*(ලකුණු 08 යි)*

**(ii) බිස්මාර්ක්**

❖ ජර්මනිය එක්සත් කිරීමේ ප්‍රධාන නියමුවා වූ ඔටෝ ෆොන් බිස්මාක් 1815 දී ප්‍රශියාවේ ඉඩම් හිමි ජුන්කර් රදළ පැලැන්තියේ පවුලක උපත ලැබීය.

❖ 1847 දී පමණ ප්‍රශියානු ඩයට් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් වූ ඔහු දැඩි කොන්සර්වේටිව්වාදියෙකු විය. 1848-49 විප්ලව සමයේ විප්ලවවාදීන්ට දැඩි ලෙස විරුද්ධ වූ බිස්මාක් රාජාණ්ඩුව ආරක්ෂා කිරීමට ප්‍රශියාව තුළ කැපවී ක්‍රියා කළේය.

❖ 1859-62 කාලය තුළ රුසියාවේ සහ ප්‍රංශයේ ප්‍රශියානු තානාපතිවරයා වශයෙන් කටයුතු කළේය.

❖ 1862 වසරේ ප්‍රශියානු පාර්ලිමේන්තුව තුළ ලිබරල්වාදීන් සහ රජු අතර ගැටුම් ඇති වූ අවස්ථාවේදී එය නිරාකරණය කිරීමට ප්‍රශියාවේ චාන්සලර්වරයා ලෙස පත් කෙරිණි.

❖ 1862 බිස්මාක් ප්‍රශියාවේ චාන්සලර් තනතුරට පත්වීම. ඔහු ප්‍රශියාවේ නායකත්වය යටතේ ප්‍රශියානු බලය ජර්මනිය පුරා ව්‍යාප්ත කොට ජර්මනිය එක්සත් කිරීමට අධිෂ්ඨාන කරගෙන සිටීම.

❖ ප්‍රශියානු හමුදාව ශක්තිමත් කිරීම.

1864: ෂ්ලෙස්විග් හා හොල්ස්ටයින් මුල්කරගෙන ඔස්ට්‍රියාව ප්‍රශියාව විසින් ඩෙන්මාර්කය පරාජය කරනු ලැබීය.

Department of Examinations - Sri Lanka

1866: ඔස්ට්‍රියාව හා ප්‍රශියාව අතර ඇති වූ සත් සති යුද්ධය; ප්‍රශියාව ජර්මනියේ ප්‍රමුඛ හා ශක්තිමත්ම බලවේගය ලෙස ඉස්මතු වීම; ප්‍රශියානු නායකත්වය යටතේ උතුරු ජර්මන් සංයුක්තය පිහිටුවීම.

1870-71: ප්‍රංශ-ප්‍රශියානු යුද්ධය; දකුණු ජර්මන් රාජ්‍ය උතුරු ජර්මන් සංයුක්තියට ඈඳා ගැනීම.

- ❖ ජර්මන් අධිරාජ්‍යයේ ප්‍රථම චාන්සලර්වරයා වීම.
- ❖ ජර්මනියේ ආරක්ෂාව පතා යුරෝපා රටවල් සමග ගිවිසුම් ක්‍රමයක් ඇති කිරීම.

*(ලකුණු 08 යි)*

**(iii) බෙනිටෝ මුසෝලිනී**

- ❖ ඉතාලි ෆැසිස්ට්වාදී නායකයාය.
- ❖ මුලදී සමාජවාදියෙකු වූ මොහු පසුව 1919 දී ඉතාලි ෆැසිස්ට් පක්ෂය ආරම්භ කිරීම.
- ❖ ඉන් තෙවසරකට පසු කළු කමිස හමුදාව සමග රෝමයට කඩා වැදී ඉතාලියේ බලය අල්ලාගැනීම.
- ❖ ඉතාලියේ අගමැතිවරයා වශයෙන් ඒකාධිපති ප්‍රතිපත්ති අනුගමනය කිරීම.
- ❖ 1936 ඇබිසීනියාව ආක්‍රමණය කිරීම.
- ❖ 1940 දී අක්ෂ පක්ෂයෙන් දෙවන ලෝක යුද්ධයට පිවිසීම.
- ❖ 1943 දී පාලන බලය අත්හැරීමට සිදුවීම.
- ❖ යුද්ධය අවසන්වන්නට සති කීපයකට පෙරාතුව 1945 දී ඝාතනයට ලක්වීම.

*(ලකුණු 08 යි)*

**(iv) 1980 තෙක් සාම සාධක ආයතනයක් ලෙෂ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ භූමිකාව**

- ❖ මේ කාලය තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානය මිශ්‍ර සාර්ථකත්වයක් අත්පත් කරගෙන ඇතැයි කිව හැකිය. විශේෂයෙන් සාමය ආරක්ෂා කරගැනීම සම්බන්ධයෙන් එය ඇතැම් අවස්ථාවලදී සාර්ථකත්වයක් අත්පත්කරගෙන ඇත. කොංගෝවේ සිවිල් යුද්ධය, බටහිර නිව්ගිනියාව සම්බන්ධයෙන් ඕලන්දය හා ඉන්දුනීසියාව අතර ඇති වූ මතභේදය වැනි මහා බලවතුන් ඍජුවම සම්බන්ධ නොවූ අර්බුද සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සාම ප්‍රයත්න සාර්ථක වූ නමුත් මහා බලවතුන්ගේ අභිමතාර්ථ සමග ගැටුන අවස්ථාවල එම සාම ප්‍රයත්න සාර්ථක නොවීය.

- ♦ එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වූ කැපීපෙනෙන ලෝක අර්බුද කීපයක් පහත දැක්වේ:
  - ▪ 1946 ඕලන්ද පාලනයෙන් නැගෙනහිර ඉන්දියා දූපත්වලට නිදහස ලබාගැනීමට ආධාර කිරීම.
  - ▪ පලස්තීනය තුළ යුදෙව්වන් හා අරාබීන් අතර ඇති වූ ගැටුම (පූර්ණ සාමයක් ඇතිකිරීමට අසමත්වීම).
  - ▪ 1950-53 කොරියන් අර්බුදය.
  - ▪ 1956 සූවස් අර්බුදය.
  - ▪ 1956 හංගේරියානු ජනතා නැගී සිටීම.
  - ▪ බෙල්ජියම්-කොංගෝ සිවිල් යුද්ධය.
  - ▪ සයිප්‍රස් ප්‍රශ්නය
  - ▪ කාශ්මීර ප්‍රශ්නය
  - ▪ 1968 චෙකොස්ලෝවෙකියානු අර්බුදය
  - ▪ 1979 රුසියාව විසින් ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කිරීම *(ලකුණු 08 යි)*

****

Department of Examinations - Sri Lanka

Department of Examinations - Sri Lanka